# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2080/21 – 2018 ජූලි 16 වැනි සඳුදා – 2018.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

**බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ, බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ, ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥා පනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2018 අගෝස්තු මස 01 වන දින සිට වලංගු විය යුතුය.

**එස්. ඒ. එන්. සරණතිස්ස,**
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2018 ජූලි මස 10 වැනි දින,
කොළඹ 05.

උපලේඛනය

බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1958 නොවැම්බර් 29 වන දින 11605 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2013 මාර්තු මස 27 වැනි දින අංක 1803/22 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද, තීරණ එම උපලේඛනයේ II කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II කොටස

**කම්කරුවාගේ පන්තිය**

*''ඒ'' පන්තියේ කම්කරුවෝ .–*

පෝමන්වරු, ප්‍රධාන බක්කරේවරු, ප්‍රධාන බාස්වරු, කෝකිහු, කේක්, ෂෝට්ඊට්ස් සාදන්නෝ, පේස්ට්‍රි සාදන්නෝ, රසකැවිලි සාදන්නෝ සහ කේක් වැඩ දාන්නෝ.

*''බී'' පන්තියේ කම්කරුවෝ .–*

මෝලි අල්ලන්නෝ, මනින්නෝ සහ කිරන්නෝ, තැටි වෙන්කරන්නෝ, ගෙතුම්කරුවෝ, සුප පාන් වැඩ කරන්නෝ, කැවිලි පිටි සාදන්නෝ, සුප පාන් යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, බදින්නෝ, බටර් සහ වැඩ දමන්නෝ, සීනි කලවම් කරන්නෝ, සීනි වැඩ දමන්නෝ සහ ඔතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ.

*''සී'' පන්තියේ කම්කරුවෝ .–*

පිටි දමන්නෝ, පිටි හලන්නෝ, රෝල් කරන යන්ත්‍රකරුවෝ, සීනි අඹරන්නෝ, මේසකරුවෝ, තැටි තෙල් ගල්වන්නෝ, තැටි වැඩ කරන්නෝ, පාන් තැටි වැඩ කරන්නෝ, බනිස් තැටි වැඩ කරන්නෝ, කේක් තැටි වැඩ කරන්නෝ, පාන් පෙති කපන්නෝ, පළතුරු සහ එළවළු ශුද්ධ කරන්නෝ, කිරම (ක්‍රීම්) පුරවන්නෝ, පෝරණු අත් උදව්කරුවෝ, පෝරණුවට තැටි දමන්නෝ, තැටි අඩුක්කරන්නෝ, පාන් සහ බනිස් අඩුක්කරන්නෝ, කේක් අඩුක්කරන්නෝ, කපන්නෝ, සසින්නෝ, අතින් ඔතන්නෝ, අහුරන්නෝ, සාමාන්‍ය අත් උදව්කරුවෝ සහ ගෙන ගොස් බාර දෙන්නෝ.

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වර්ෂය | ''ඒ'' පන්තිය<br>රු. ශ. | ''බී'' පන්තිය<br>රු. ශ. | ''සී'' පන්තිය<br>රු. ශ. |
|---|---|---|---|
| 1 වර්ෂය | 12,180.00 | 11,125.00 | 10,070.00 |
| 2 වර්ෂය | 12,330.00 | 11,250.00 | 10,170.00 |
| 3 වර්ෂය | 12,480.00 | 11,375.00 | 10,270.00 |
| 4 වර්ෂය | 12,630.00 | 11,500.00 | 10,370.00 |
| 5 වර්ෂය | 12,780.00 | 11,625.00 | 10,470.00 |
| 6 වර්ෂය | 12,930.00 | 11,750.00 | 10,570.00 |
| 7 වර්ෂය | 13,080.00 | 11,875.00 | 10,670.00 |
| 8 වර්ෂය | 13,230.00 | 12,000.00 | 10,770.00 |
| 9 වර්ෂය | 13,380.00 | 12,125.00 | 10,870.00 |
| 10 වර්ෂය | 13,530.00 | 12,250.00 | 10,970.00 |
| 11 වර්ෂය | 13,680.00 | 12,375.00 | 11,070.00 |

08 – 51

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.